**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කට අදාළ ඉදිකිරීම් හා අලුත්වැඩියා ඇස්තමේන්තු අගය රු.218,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | රු.650,000 කට ඇස්තමේන්තු කර තිබුණු වරාපිටිය මහජන පුස්තකාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අවලංගු කර තිබියදී එම වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ගලගොඩ ආයුර්වේද ගොඩනැගිල්ලේ විදුලිය ලබා ගැනීම හා පැති බැම්ම අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම්ගත වටිනාකම රු.300,000 ක් වැඩියෙන්ද වාවින්න මහජන පුස්තකාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම රු.100,000 ක් අඩුවෙන්ද ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ගිවිසුමකට එළඹීමකින් හෝ වෙනත් බැඳීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති 02 ක ඇස්තමේන්තුගත වටිනාකම එකතුව රු.26,000,000 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | මෝටර් රථ හා අත් කරත්ත යටතේ රු.715,550 ක් ලෙස දක්වා තිබුණු ට්‍රැක්ටරයක් රු.813,000 ක් ලෙස නැවතත් මෝටර් රථ යටතේ වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයන් 07 කට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.43,864,689 ක වෙනසක් පැවතුණි. | වෙනස නිවැරදිව හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන යෙදුමට අදායමින් හා ආධාර මඟින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.1,379,380,149 ක් වුවද ස්ථාවර වත්කම් ශේෂය රු.1,380,448,706 ක් වූයෙන් රු.1,068,557 ක වෙනසක් පැවතුණි. | පුස්තකාල පොත් ප්‍රාග්ධනිත නොකළ බව. | -එම- |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පැවත එන රු.15,382 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.10,772,783 ක අත්තිකාරම් ශේෂයට අදාළ ලිපිගොනු හා ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිවැරදිව උපලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | නිවැරදි උපලේඛන පවත්වාගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.334,216,894 ක වත්කම් ශේෂ 08 කට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී නිවැරදිව උපලේඛන පවත්වාගෙන යන බව. | නිවැරදිව ලිපිගොනු හා ලේඛන පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්වල ආදායමින් සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් ලබාගත යුතු වුවද, හෝටල් 02 කින් 2015 සිට 2018 දක්වා වූ | නඩු පවරා අය කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කාලපරිච්ඡේදයට අදාළ රු.21,135,367 ක බලපත්‍ර ගාස්තුව අයකර ගෙන නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(3) වගන්තිය | සභාව සතු කැබ් රථය හදිසි ගිනි ගැනීමකට ලක්වී තිබූ අතර ඒ සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | පැමිණිල්ලේ පිටපතක් ලබා ගැනීමට නොහැකි වූ බැවින් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.181,233,144 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,544,674 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 42,815,634 | 37,318,164 | 30,625,957 | 47,531,542 | 42,995,486 | 36,816,223 | 22,022,975 | 40,839,335 |
| (ii) | කුලී | 8,781,619 | 24,389,340 | 11,056,666 | 22,114,206 | 11,824,419 | 6,254,380 | 14,514,014 | 8,781,532 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,985,000 | 3,171,436 | 3,171,436 | - | 8,801,000 | 2,510,362 | 2,510,362 | - |
| (iv) | වෙනත් ආදායම් | 141,109,000 | 223,083,960 | 188,026,719 | 35,904,394 | 117,974,000 | 53,581,810 | 169,179,467 | 847,153 |
| | | 198,691,253 | 287,962,900 | 232,880,778 | 105,550,142 | 181,594,905 | 99,162,775 | 208,226,818 | 50,468,020 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.47,475,321 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්ම වූ දේපල 450 කින් එකතුව රු.22,405,446 ක් විය. | දේපල තහනම් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | පනත හා රීති ප්‍රකාරව ආදායම් අය කළ යුතුය. |

**(ආ) කඩ කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කාමර කුලී ශේෂය රු.4,239,976 ක් විය. | කුලී නොගෙවන්නන් පිළිබඳ නීත්‍යානුකූල කටයුතු කරන බව. | පනතේ විධිවිධාන හා ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | දිගන බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 33 ක් සඳහා 2021 ඔක්තෝබර් 06 දිනැති තක්සේරු වාර්තාව අනුව කඩ කුලී අය නොකර 2015 පෙබරවාරි 26 දිනැති මහා සභා තීරණය අනුව කුලී අය කිරීම හේතුවෙන් 2021 වර්ෂයේ නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.1,216,600 ක් ද දිගන රණවිරු වීදියේ කඩ කාමර 86 ක් සඳහා 2022 ජුලි 27 දින සිදුකළ තක්සේරු වාර්තාව අනුව කුලී අය නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.367,000 ක් වශයෙන් එකතුව රු.1,583,600 ක කුලී සභාවට අහිමි වී තිබුණි. | විරෝධතා සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගන්නා බව. | නව තක්සේරුව අනුව කුලී අයකළ යුතුය. |
| (iii) | බලගොල්ල මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 48 ක් සඳහා 2020 සැප්තැම්බර් 04 ඉදිරිපත් කළ තක්සේරු වාර්තාව අනුව කුලී අය නොකර 2014 ජනවාරි 30 දින පැවති සභා තීරණය මත කුලී අය කිරීම හේතුවෙන් 2020 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.8,235,000 ක් කුලී ආදායම් සභාවට අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | -එම- |
| (iv) | මැණික්හින්න නව සිව්මහල් ගොඩනැගිල්ල 2018 ජනවාරි 01 දින ගිවිසුම්ගතව මාසික කුලිය රු.100,000 කට පෞද්ගලික ආයතනයක් වෙත වසර 10 කට බදු පවරා තිබුණි. 2022 සැප්තැම්බර් 06 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව අනුව රු.300,000 ක තක්සේරු මුදල 2018 ජනවාරි 01 දින සිට ඉදිරි වර්ෂ 05 ක කාලයක් සඳහා අයකළ හැකි බව දක්වා ඇතත්, 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ මාස 60 ක කාලයක් සඳහා සභාව විසින් මාසිකව රු.100,000 බැගින් රු.6,000,000 ක මාසික කුලියක් අයකර ගෙන තිබුණි. සභාව විසින් තක්සේරු වාර්තාව අනුව කුලී අය නොකිරීම හේතුවෙන් සභාවට රු.12,000,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | විරෝධතා පිළිබඳ තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (v) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර අතුරු බදු දීම නොකළ යුතු බව දක්වා ඇතත් මැණික්හින්න නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් හා මැණික්හින්න පොදු වෙළඳපොල පළමු මහල කඩ කාමර 03 ක් අතුරු බදු දී තිබුණි. | අතුරු බදු ලබා දුන් අය සම්බන්ධ නීත්‍යානුකූල කටයුතු කළ හොත් සභාවට ආදායම අහිමි වී යාමට ඉඩ ඇති බව. | ගිවිසුම් හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (vi) | මැණික්හින්න පොදු වෙළඳපල බිම් මහලෙහි පිහිටි කඩ කාමර 04 ක 2017 සැප්තැම්බර් 19 දිනැති තක්සේරු වාර්තාව අනුව කුලී අය නොකිරීම හේතුවෙන් 2019 වර්ෂයේ ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා මාස 39 ක කාලපරිච්ඡේදයක් සඳහා අදාළ කඩ කුලී රු.177,450 ක් අඩුවෙන් අයකර තිබුණි. | නව ගිවිසුමකට එළඹ අදාළ මුදල් ගෙවන ලෙසට දන්වා ඇති බව. | නව තක්සේරුව අනුව කඩ කුලී අය කළ යුතුය. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.6,931,996 ක් හා මුද්දර ගාස්තු රු.23,522,834 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.196,623,493 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.194,352,328 ක් විය. | ඉදිරියේදී අය කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.334,633,940 ක් විය. ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.196,873,889 ක් විය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වාගෙන යන බැංකු ගිණුමේ රු.7,352,748 ක මුදල් ඵලදායී සංවර්ධන කටයුත්තකට යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන නැවතුම්පලක් ඉදිකිරීමට අපේක්ෂා කරන බව. | ඵලදායී සංවර්ධන කටයුත්තකට යොදවාගත යුතුය. |
| (ඈ) | සභාව සතු ඉඩම් 03 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන බව හා ආරවුලක් හේතුවෙන් වටිනාකම හඳුනාගැනීමට නොහැකි බව. | නිරවුල්ව අයිතිය පවරා ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.869,900 ක වාහන 03 ක් හා වටිනාකම හඳුනාගෙන නොමැති වාහන 02 ක් වසර 06 සිට 10 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | වෙන්දේසි කිරීමට හා නැවත පවරා දීමට කටයුතු කරන බව. | අපහරණය කිරීමට හෝ පවරා දීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව භාවිතා කරන කැබ් රථයේ හා ඩිෆෙන්ඩර් රථයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ගල් රෝල් යන්ත්‍රය හා බොබ් කැට් යන්ත්‍රය ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | පවරා දීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව පරිහරණය කරන ඉඩම් කොටස් 20 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරාගත යුතුය. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාපතිවරයා විසින් භාවිතා කරන වාහනය 2020 ඔක්තෝබර් 04 දින සිට 2022 මාර්තු 22 දින දක්වා කාලය තුල අලුත්වැඩියාව සඳහා යොමුකර තිබීම හේතුවෙන් සභාව සතුව කැබ් රථ 03 ක් තිබියදී සභාපතිවරයාගේ භාවිතය සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකර කුලී පදනම මත වාහනයක් ලබාගෙන මාස 17 ක කාලයක් සඳහා රු.1,073,945 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. තෝරාගත් වාහනයට අදාළ වාහනයේ අයිතිය, | වාහනය අලුත්වැඩියාවට දීර්ඝකාලයක් ගතවීම හා සංචිත වාහනයක් ලබා දුන්නේ නම් දෛනික රාජකාරී ඉටු කිරීමට නොහැකි වන බව. | පවතින වාහන උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචිය, වාර්ෂික බලපත්‍ර හා රක්ෂණ ආවරණය පිළිබඳ තොරතුරු ලබා ගැනීමකින් තොරව අදාළ වාහනය කුලී පදනම මත ලබාගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය. | | |
| (ආ) | කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ වී ගිවිසුම්ගතව 2016 වර්ෂයේ ජපන් ආධාර යටතේ ආරම්භ කරන ලද අලුත්වත්ත පොහොර සැකසුම් කිරීමේ හා ගබඩා අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ උපයාගෙන තිබුණු රු.22,091,556 ක ආදායම ගිවිසුම් අනුව සභා දෙක අතර සම සමව බෙදා ගැනීමට කටයුතු කලයුතු වුවද පාතදුම්බර ප්‍රාදේශීය සභාවට ලබාදිය යුතු මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ලබා දී නොතිබුණි. | දැරීමට සිදුවන වියදම් දෙපාර්ශවයේ එකඟත්වය මත සිදු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී තනතුරු 10 ක පුරප්පාඩු 21 ක් ද එක් තනතුරක අතිරික්තතා 20 ක් ද පැවතුණි. | රජයේ ප්‍රතිපත්ති මත බඳවාගැනීම් අත්හිටුවීම හේතුවෙන් පුරප්පාඩු ඇති වී ඇති බවත් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම හේතුවෙන් අතිරික්ත වූ බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | **සේවක ණය**<br>2002, 2018 – 2021 කාලපරිච්ඡේදය තුළ විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් හා සේවකයින් 07 දෙනෙකුගෙන් රු.1,276,679 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 25 ක සියයට 22 සිට සියයට 100 දක්වාද, වියදම් විෂයයන් 23 ක සියයට 29 සිට සියයට 99 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව අයවැය සකස් කිරීමට කටයුතු කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල කර ගත යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ළඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හා දර්ශක යම්තාක් දුරට හඳුනාගෙන ඇති බව. | ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |